සියලුම හිමිකම් ඇවිරිණි/All Rights Reserved/முழுப் பதிப்புரிமையுடையது

ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha Education Zone ගම්පහ අධ්‍යාපන කලාපය Gampaha ගම්පහ අධ්‍යාපන

## ගම්පහ අධ්‍යාපන කලාපය
## Gampaha Education Zone

දෙවන වාර ඇගයීම - 2025

**Second Term Evaluation - 2025**

| | | |
|---|---|---|
| ශ්‍රේණිය Grade **09** | විෂයය Subject **සිංහල භාෂාව හා සාහිත්‍යය** | කාලය Time පැය 2 |

**නම-.........................................................................** **පන්තිය-...................**

**I කොටස**

**සැලකිය යුතුයි.**

- **I කොටසේ ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.**
- **අංක 01 සිට 20 දක්වා ප්‍රශ්නවල නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.**
- **II කොටසේ 1,2,3, ප්‍රශ්න අනිවාර්ය වේ.4,5,6,7 යන ප්‍රශ්නවලින් දෙකක් පමණක් තෝරා පිළිතුරු සපයන්න.**

**ප්‍රශ්න 1 හි ඉරි ඇඳි ප්‍රස්තාව පිරුළෙහි අර්ථය හා ප්‍රශ්න 2 හි ඉරි ඇඳි ඉඟි වැකියේ නිවැරදි අර්ථයත් 3 හි ඉරි ඇඳි ආප්තෝපදේශයෙහි අර්ථයත් නිවැරදි ව තෝරන්න.**

01) සුමනදාස සාත්තු සේවකයාට බැණ වැදුණේ, **පය බරවායට පිටි කර බෙහෙත් බැඳීමෙන්** වළකින ලෙසයි.

1. කළ යුතු දෙය තිබියදි අනවශ්‍ය දෙය කිරීමෙන්

2. නොකළ යුතු දෙය තිබියදි අවශ්‍ය දෙය කිරීමෙන්

3. බරවා රෝගයට බෙහෙත් බැඳීමෙන්

4. බෙහෙත් පිටි වන තෙක් ඇඹරීමෙන්

02) ''සිරිපාල මාමාගේ වැඩ **කිරි ගහට ඇන්නා වගේ** යැ''යි තාත්තා පැවසුවේ ය.

1. කිරි එන ගසක් තෝරා කැපීම වගේ

2. ස්ථිර ලෙස ම සාර්ථක වන්නේ

3. ස්ථිර ලෙස ම අසාර්ථක වන්නේ

4. බොහෝ සුබ වන්නේ

03) සමන්තගේ හැසිරීම් දෙස ඕනෑ කමින් බැලූ ගුරුවරයා කියා සිටියේ, **හැදෙන ගහ දෙපෙත්තෙන් දැනේ** යනුවෙනි.

1. මුල් ම පත්‍ර දෙකින් ගහ හඳුනා ගත හැකි බව ය.

2. යම් කෙනෙකු අනාගතයේ කවුරුන් වේ ද යන්න කුඩා කල ම ගතිගුණවලින් දැන ගත හැකි බව.

3. වර්තමාන හැසිරීමෙන් අනාගතය කිව හැකි බව.

4. ගහක පත්‍ර එකින් එක හැදෙන්නා හා සමාන ව අනාගතය ගොඩනැගෙන බව.

04) මුලින් දී ඇති පදයට සමානාර්ථයක් **නොදෙන** පදය ඇතුළත් වරණය තෝරන්න.

1. සතුට -සොම්නස, ප්‍රීතිය, තොස ,ආනන්දය

2. ජලය -උදක, පැන්, අඹ, නී

3. රන් -කසුන්, රත්තරන්, රජත, ස්වර්ණ

4. ගස -වෘක්ෂය, තුරු, පාදප, දැම

05) මුලින් දී ඇති පදයට විරුද්ධාර්ථය දෙන පදය ඇතුළත් **නො වූ** පිළිතුර තෝරන්න.

1. ආලෝකය-අන්ධකාරය , ශීල-දුශ්ශීල , දේශීය-විදේශීය, පක්ෂ-විපක්ෂ

2. ප්‍රතිපත්ති-දුශ්ප්‍රතිපත්ති, ආගමන-විගමන , නම්බුව-අවනම්බුව ,දුලබ -සුලබ

3. වංක-අවංක, පුරුදු-සුපුරුදු , ආනයන-අපනයන, දුටු-නොදුටු

4. තෙත්-වියළි ,ප්‍රබල-දුබල, සෝෂ-අඝෝෂ, සරු-නිසරු

06) ආචාර්ය එස්.පණීභාරතයන් සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය තෝරන්න.

1. කෑගල්ල එතුමාගේ උපන් ගමයි.

2. එතුමා මිය ගිය දිනය එනම්,පෙබරවාරි 24 ජාතික නර්තන දිනය ලෙස නම් කරන ලදි.

3. ලාංකීය 'නර්තනයේ පියා ' ලෙස එතුමා හඳුන්වයි.

4. ගුවන් විදුලි සංස්ථාව ප්‍රථම වරට විවෘත කිරීමේ අවස්ථාවේ මඟුල් බෙර වැයුවේ එතුමා ය.

07) පහත යුගල පද අතරින් සියලු යුගල පද නිවැරදි ව යෙදුණු පිළිතුරු තෝරන්න.

1. අඟර-දඟර, ළමයි-බමයි, අබල-දුබල, යන්ත්‍ර-ගුරුකම්

2. කා-බී, ලවක්-දෙවක්, දුක්-දොම්නස්, වං-හුං

3. ඔප්පු-තරප්පු සමිති-සමාගම්, හිතන-පතන, ලෙඩ-රෝග

4. ඉඩම්-කඩම්, නඩු-හබ, උදව්-ආධාර, වත්ත-පිටිය

08) දන්තජ හා ඕෂ්ඨජ අක්ෂර පමණක් අන්තර්ගත වචනය තෝරන්න.

1. පහන 2. ධනය 3. තාලම්පට 4. සමනල

09) පැරණි සිංහල අධ්‍යාපන ක්‍රමයේ ශබ්ද නිවැරදි ව උච්චාරණය පුහුණු කරවීමට රචනා **නොකළ** ග්‍රන්ථය වන්නේ,

1. සකස්කඩ 2. මඟුල් ලකුණ 3. සිදත් සඟරාව 4. නම්පොත

10) වැරදි ලෙස විරාම ලකුණු යෙදුණු පිළිතුර තෝරන්න.

1. ප්‍රසංගය ප.ව.5.00ට ආරම්භ වේ.

2. ප්‍රසංගය සඳහා ඔබතුමාට-ඔබතුමියට-ඔබ සැමට ගෞරවයෙන් ආරාධනා කර සිටිමි.

3. ප්‍රසංගය නැටුම්, ගැයුම්, වැයුම්වලින් සමන්විත විය.

4. ' පිපෙන කැකුළු ' ප්‍රසංගය, සැමගේ ආකර්ෂණය දිනා ගන්නා ලදි.

11) නිවැරදි අක්ෂර වින්‍යාසයෙන් යුතු වචනය තෝරන්න.

1. මර්ධනය 2. පරිඝණකය 3. ලේකම් 4. ශ්‍රවනාගාරය

12) දේශාභිමානී කාව්‍ය නිර්මාණ රචකයෙකු නොවන්නේ,

1. මාර්ටින් වික්‍රමසිංහ 2. අරිසෙන් අහුබුදු

3. කුමාරතුංග මුනිදාස 4. ආනන්ද රාජකරුණා

13) නාම විශේෂණ හා ක්‍රියා විශේෂණ පද පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.

1. සිඟිති දියණිය හඬයි.

2. ළමයා වේගයෙන් දුවයි.

3. පරිස්සමෙන් විනීත රියදුරු රිය පදවයි.

4. යොවුන් විය සෙමින් නිමවෙයි.

14) පහත ග්‍රාමනාම අකාරාදි පිළිවෙළට සැකසූ විට නිවැරදි පිළිතුර වන්නේ,

රාගම, බටගොල්ල, කිරිල්ලවල, අම්පාර, කඩවත

1. අම්පාර, කිරිල්ලවල, කඩවත, බටගොල්ල, රාගම

2. අම්පාර, කඩවත, කිරිල්ලවල, රාගම, බටගොල්ල

3. අම්පාර, බටගොල්ල, රාගම, කඩවත, කිරිල්ලවල

4. අම්පාර, කඩවත,කිරිල්ලවල, බටගොල්ල, රාගම

15) ධීවර බස වැරදි ලෙස දක්වා ඇති පිළිතුර තෝරන්න.

1. දැල-ජාලය 2. දැල් අදින්නෝ-අම්බාවෝ

3. මුහුදු රළ-ඉයත්තාව 4. වර්ෂාව-කෝඩය

16) උක්ත පදයක් හා අනුක්ත පදයක් පිළිවෙළින් ඇති පිළිතුර තෝරන්න.

1. මම , අපි 2. කාන්තාවෝ , අප

3. ඔවුන් , බල්ලෙකු 4. මා , ගුරුවරු

17) කුමාරතුංග මුනිදාසයන් අතින් ලියවුණු ග්‍රන්ථයක් නොවන්නේ,

1. පියසමර 2. හත්පණ 3. ජාතික තොටිල්ල 4. කියවන නුවණ

18) කිසිවෙකුට දෙවෙනි නොවන ' යන්නට යෙදෙන තනි පදය තෝරන්න.

1. අද්විතීය 2. ද්විතීය

3. තෘතීය 4. නොදෙවෙනි

19) මුලින් දී ඇති පදයට බහු අර්ථ පදයක් ඇතුළත් නොවන පිළිතුර තෝරන්න.

1. නා -ඇතා, නාගයා , නායකයා, නාගස

2. දද -කුෂ්ඨය, ජනයා ,අනුවණ, කොඩි

3. කර -බෙල්ල, අත, රශ්මිය, කරන්න

4. දිය -ජලය, දෙන්න, ලෝකය, ජයග්‍රහණය

20) ළමයින් සඳහා ලියූ ප්‍රථම සිංහල මුද්‍රිත කෘතිය හා එහි ලේඛකයා නිවැරදි ව සඳහන් පිළිතුර තෝරන්න.

1. කුමාරතුංග මුනිදාස-මඟුල් කෑම

2. ආනන්ද රාජකරුණා-ළදරු ගී

3. චාර්ලිස් කරුණාතිලක-මගේ සිරිත

4. ඩබ්.වී.අන්දිරිස් අප්පුහාමි-හෝඩි පොත

## II කොටස

- **පළමු හා දෙවන හා තෙවන ප්‍රශ්න අනිවාර්ය වේ.**
- **4,5,6,7 යන ප්‍රශ්නවලින් කැමති ප්‍රශ්න 02කට පිළිතුරු සපයන්න.**

01) පන්ති කාමරයේ දී ඇගයීම් ප්‍රභේදයක් ලෙස සිදු කළ මාතෘකානුකූල කථා ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. මාතෘකානුකූල කථාවක් සිදු කිරීමේ දී අවධානය යොමු කළ යුතු කරුණු 4ක් ලියන්න. (ල 4)

2. ගුරුතුමිය ඔබට ලබා දුන් මාතෘකා 02ක් ලියන්න. (ල 2)

3. එයින් ඔබ තෝරා ගත් මාතෘකාවට අනුව කථාව සැලසුම් කළ ආකාරය කෙටියෙන් ලියන්න.(කොටස්වලට බෙදූ අයුරු) (ල 2)

4. ගුරුවරයා මේ සඳහා ඔබට ලකුණු ලබා දුන් නිර්ණායක 2ක් ලියන්න. (ල 2)

5. මෙම ක්‍රියාකාරකම ඇසුරින් ඔබට ලැබුණු ප්‍රයෝජන 2ක් ලියන්න. (ල 2)

6. මෙම ක්‍රියාකාරකම සිදු කිරීමේ දී ඔබ මුහුණ දුන් ගැටලු 02ක් ලියන්න. (ල 2)

(ල 14)

02) පහත දැක්වෙන මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200ක පමණ රචනයක් ලියන්න.

1. විශ්ව දැනුමින් පිරි පඬිවරයෙක්,රසිකත්වයෙන් පිරිපුන් කලා විශාරදයෙක්,විද්‍යා ,කලා පර්යේෂණයේ ස්වාධීන අදහස් පළ කළ දාර්ශනිකයෙක් ලෙසත්, පෙරදිග සංස්කෘතියෙහි විශිෂ්ටත්වය ලෝවැසියන්ට හඳුන්වා දීමට විශාල උත්සහයක් ගත් ප්‍රකට විද්වගෙක් ලෙස ' ආනන්ද කේ.කුමාරස්වාමි' මහතා හැඳින්විය

හැකිය. 'ආනන්ද කුමාරස්වාමි මහතාගෙන් ශාස්ත්‍රීය හා කලා ක්ෂේත්‍රය වෙනුවෙන් සිදු වූ සේවය ' මැයෙන් රචනයක් ලියන්න.

2. ජංගම දූරකථනය වර්තමානයේ සන්නිවේදන කාර්යයන් සඳහා අත්‍යවශ්‍ය දෙයක් බවට පත් ව ඇත.අධ්‍යාපන කාර්යයන් සඳහා මෙමගින් ප්‍රයෝජන රැසක් ලබා ගත හැකි වන අතර එය අනිසි ලෙස භාවිත කිරීමෙන් අත් වන අයහපත් ප්‍රතිඵල ද ඉතා දරුණු ය. වර්තමාන තරුණ පරපුර බොහෝ ව්‍යසනයන්ට මුහුණ දීමට ද මෙය හේතුවක් වී ඇත.මෙම කරුණු සලකා 'ජංගම දූරකථනය හා තරුණ පරපුර ' මැයෙන් රචනයක් ලියන්න.

3. ළමයින්ගේ කියවීම සඳහා සම්පාදනය කෙරෙන ගද්‍ය,පද්‍ය හා නාට්‍ය යනාදි නිර්මාණ 'ළමා සාහිත්‍ය නිර්මාණ' ලෙස හැඳින් වේ.ළමයින්ගේ භාෂා ඥානය දියුණු කිරීමත්,වාක් කෝෂය පුළුල් කිරීමත් එමගින් අපේක්ෂිත ය. 'සිංහල ළමා සාහිත්‍ය නිර්මාණ' යන මැයෙන් රචනයක් ලියන්න.

4. දිනෙන් දින වැඩි වන රිය අනතුරු හේතුවෙන් වටිනා මිනිස් ජීවිත අපේ රටට නිකරුණේ අහිමි වී යයි.රියදුරන්ගේ මෙන් ම පදිකයන්ගේ ද වැරදි විටක මෙම අනතුරුවලට හේතු විය හැකිය.මෙම අනතුරු වළකාලීමට නම් සමාජය මීට වඩා වගකීමෙන් කටයුතු කළ යුතු වේ. ' රිය අනතුරු අවම කර මිනිස් ජීවිත සුරකිමු.' යන මාතෘකාවට රචනයක් ලියන්න.

(ල 16 )

03) ගම්පහ එක්සත් වෙළෙඳ සංගමය විසින් එළඹෙන සාහිත්‍ය මාසය වෙනුවෙන් 'මහා පොත් ප්‍රදර්ශනයක්' ගම්පහ නගරය කේන්ද්‍ර කොට ගනිමින් පවත්වන්නට තීරණය කර ඇත.මෙම ප්‍රදර්ශනය සඳහා ගම්පහ නගරයේ ග්‍රන්ථ අලෙවි කරන ප්‍රධාන පොත් අලෙවිසැල් හිමිකරුවන් විශාල පිරිසක් ද නගරයෙන් පිට දිස්ත්‍රික්කය පුරා විහිද සිටින පොත් ප්‍රකාශකයින් බොහොමයක් ද සහභාගී වීමට කැමැත්ත පළ කර ඇත.මෙම ප්‍රදර්ශනය මගින් සහනදායි වට්ටම් ඇතුළු වාසි ගණනාවක් සියලු ම මහජනතාවට ලබා දීමට නියමිත ය.එහෙයින් මෙම ප්‍රදර්ශනය පැවැත්වීම සඳහා ගම්පහ නගරයේ ජනාකීර්ණ ප්‍රදේශයක සුදුසු රජයේ භූමියක් තාවකාලික පදනම මත මුදල් ගෙවා වෙන් කර දෙන මෙන් ඉල්ලා එක්සත් වෙළෙඳ සංගමයේ ලේකම් විසින් ගම්පහ ප්‍රාදේශීය ලේකම්ට ලිපියක් ලියයි.තාවකාලික වෙළෙඳ කුටි 50ක් පමණ ඉදි කළ හැකි බිමක් අදාළ මුදල් ගෙවා ලබා ගැනීමත් රථ ගාල් හා අනෙකුත් සනීපාරක්ෂක සේවා පහසුකම් ලබා ගැනීමත් මෙම ලිපියේ අනෙකුත් අරමුණු අතර විය.ඔබ සංගමයේ ලේකම් යැයි සිතා ප්‍රාදේශීය ලේකම්ට යවන ලිපිය සකස් කරන්න.වචන 100ක් පමණ සෑහේ.

(ල 10 )

04) පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

1. '' පුත, ඔබ බෝසත්වරයෙකි.ඔබට බුදුබව ලැබේවා ! යි ප්‍රාර්ථනා කරමි.දැන් ඉතින් මට ප්‍රීතියෙන් මගේ අවසන් ගමන යා හැකි ය''යි කීවා ය.

(අ) මෙය ප්‍රකාශ කළේ කවුරුන් ද?

(ආ) මෙම පාඨය උපුටා ගත් කතාව ඇතුළත් ග්‍රන්ථයේ කතුවරයා කවුද?

2. '' ස්වාමීනී,සිටු පුත්‍රයාණන් වහන්ස,බොහෝ කලක් ජීවත් වුන මැනව.අපි නුඹ වහන්සේට පිනට කන්ට බොන්ට සමර්ථ වූම්හ'යි කී කල්හි,

(අ) මෙහි සඳහන් සිටු පුත්‍රයාගේ නම කුමක් ද?

(ආ) මෙම පාඨය උපුටා ගත් කතා වස්තුව ඇතුළත් ග්‍රන්ථය කුමක් ද?

3. '' ඔබගේ විවරණය හරි බවට බැහැරින් දෙස් නුවුවමනා යැ.කවර හෙයෙකින් වුව ද අපගේ වරද පිළිගනිමු.මෙය හෙළි කිරීම ගැන අපි ඔබට ණය වම්හ.''

(අ) මෙය කවරෙකු විසින් කළ ප්‍රකාශයක් ද?

(ආ) මෙම ප්‍රකාශය උපුටා ගත් සඟරාව කුමක් ද?

4. '' පුතේ, මම බෙරේ කරේ දාගෙන හැතැප්ම ගණන් පයින් ගිය කෙනෙක් ''

(අ) මෙය ප්‍රකාශ කළේ කවුරුන් ද?

(ආ) ඉහත ප්‍රකාශකයා වඩාත් ම ප්‍රසිද්ධියක් දැරුයේ ,කවර ක්ෂේත්‍රයක් සඳහා ද?

5. දත් කැකුළු පාලා
සුරතල් සිනා සීලා
බොළඳ බස් දීලා
කෙළී සියොලඟ දූලි ගාලා

(අ) මෙම කවිය උපුටා ගත් ග්‍රන්ථය කුමක් ද?

(ආ) එම ග්‍රන්ථයෙහි රචකයා කවුද?

(ල 10 )

05) පහත දී ඇති කර්තෘකාරක වාක්‍ය කර්මකාරකයට හරවා ලියන්න.

1. පොලිස් නිලධාරියා සොරුන් ලුහුබඳිති.

2. මම දෙගුරුන් නමදිමි.

3. කුමාරතුංග මුනිදාස ශූරීහු ග්‍රන්ථ රැසක් ලියූහ.

4. දෙමව්පියෝ දරුවන් රකිති.

5. ගුරුවරු ශිෂ්‍යයන් හික්මවති. (ල 10 )

06) පෙළපොතේ ඇති පහත 1 හා 2 කවි සම්පූර්ණ කරන්න. 3 වන කවිය නිර්මාණාත්මක ව සම්පූර්ණ කර මාතෘකාවක් යොදන්න.

| | | | |
|---|---|---|---|
| 1. මගෙ රට මගෙ දැය | නිසා | 2. මල්වල සුමිහිරි | පැණි |
| යුදු වැද සතුරන් | නසා | ඇද බොන බමරා | මෙනී |
| ........................................................................ | | ........................................................................ | |
| ........................................................................ | | ........................................................................ | |

(ල 04 බැගින් 8 )

3. හෝ ගාමින් රැල්ල නැගෙයි

සුදු පෙණ කැටි වෙරළෙ හැපෙයි

............................................................................

............................................................................ (ල 02 )

(ල 10 )

07) (අ) පහත වාක්‍ය සඳහා සුදුසු වචනය තෝරන්න.

1. තාරකා පෙළ අහසේ ................... (බබලයි/බබලති)

2. සමහරු නීතිය කඩ ................... (කරයි/ කරති)

3. මැණියන් දෑ දරුවන් පෝෂණය .......................(කරන දෑ ය/ කරයි)

4. එක් අයෙක් සතුටින් ..........................(නටයි/නටති)

5. සිටාණෝ ධනය විනාශ ...................(කෙරුවේය/කළහ)

6. මම හොඳින් විභාගය සමත්...................(වෙමි/ වෙයි)

7. ඔවුහු රට සංවර්ධනය ............................(කළහ/ කළෝය)

8. ගොවියෝ ........................ ( අම්බරුවෝ/ අම්බරුවන්) කුඹුරට දක්කති.

9. ................................(සේවිකාවක්/සේවිකාවක) දරුවා රැක බලා ගත්තා ය.

10. සභා ......................( තොමෝ /තුමූ )සතුටින් විසිර ගියාය.

(ල 1 බැගින් 10 )